din-08-16-uns-079199-30x4-akw

WC - 695

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

### නුවරඑළිය - ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ යෝජිත සංවර්ධනය සඳහා

### ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

### කනිෂ්ඨ කාර්ය මණ්ඩල නිල නිවාස හා ශරීර සුවතා මධ්‍යස්ථානය (Gymnasium) ඉදිකිරීම - පළමු අදියර

### IFB අංකය : LK-ESCAMP - PMU-102579 - CW-RFB

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුව වෙතින් පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ පිරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය මුදලින් කොටසක් ශ්‍රී ලංකාව, නුවරඑළිය – ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

2. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා නුවරඑළියේ ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ යෝජිත ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය ඉදිකිරීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ. ඇස්තමේන්තුගත පිරිවැය වැට් බදු රහිතව **රු. මිලියන 215 කි.** මෙම කර්මාන්තයේ විෂය පථයට ගොඩනැගිලි සැලසුම්, පිරිවිතර, පාරිසරික කළමනාකරණ සැලැස්ම හා ප්‍රමාණ පත්‍රවල විස්තර කොට ඇති පරිදි යාන්ත්‍රික හා විදුලි කර්මාන්ත ඇතුළු නුවරඑළිය වන වන විද්‍යායතනයේ ගොඩනැගිලි එකොළහක (11) සිවිල් කර්මාන්ත අඩංගු වේ.

   ඉදිකිරීම් කාලය **දින 450 (මාස 15) කි.**

3. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

   ත කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

   ත ලංසුකරු ගොඩනැගිලි ඉදිකිරීම් විශේෂතාවය සඳහා CIDA (කලින් ICTAD යනුවෙන් හඳුන්වන ලද) ආයතනයේ සී 2 (C2) හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

   ත පසුගිය වසර පහ තුළ ඉටුකරන ලද ඉදිකිරීම් කර්මාන්තවල වාර්ෂික ධාරිතාවයේ සාමාන්‍යය අවම වශයෙන් රු. මිලියන 350 ක් විය යුතුය.

   ත මෙම කොන්ත්‍රාත්තුව යටතේ සිදුකරන ලද අත්තිකාරම් ගෙවීම් හැර තිබිය යුතු ද්‍රවශීල වත්කම් සහ / හෝ ව්‍යාපෘතියට නියමිත ණය පහසුකම් රු. මිලියන 60 ට අඩු නොවිය යුතුය.

4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82, "සම්පත්පාය" පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන අංශය වෙතින් 2019.09.09 **වෙනි දින දක්වා පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර** කාර්යාල වේලාව තුළදී ලබාගත හැකිය. ඉහත ලිපිනයේදී සාමාන්‍ය කාර්යාල වේලාව තුළදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය. **(දුරකථන අංක** : 0112888426/ 0112888427)

5. ආපසු ගෙවනු නොලබන **රු.** 45,000.00 ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2019.08.16 **වෙනි දින සිට** 2019.09.09 වෙනි දින දක්වා **බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82 පිහිටි "සම්පත්පාය", පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත** ලිඛිත අයදුම්පතක් සමග CIDA ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරනලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගණකාධිකාරී වෙත සිදුකළ යුතුය.

6. පිටපත් දෙකකින් යුතුව සම්පූර්ණ කරන ලද ලංසු මුද්‍රා තබන ලද "මුල් පිටපත" සහ "අනු පිටපත" ලෙස සඳහන් කරන ලද කවර දෙකක වෙන් වෙන් වශයෙන් බහා එම කවර දෙක නැවත තනි කවරයක බහා එහි ඉහළ කෙළවරේ කොන්ත්‍රාත් අංකය සහ ඉදිකිරීම් ශීර්ෂය සඳහන් කර පහත සඳහන් කරන ලද ලිපිනය වෙත **2019.09.10 වෙනි දින පෙ.ව. 11.00** ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82 පිහිටි "සම්පත්පායේ", පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

7. වැඩ බිම් සංචාරය සහ පරීක්ෂා කර බැලීම **2019.09.03 වැනි දින පෙ.ව. 10.00** ට පැවැත්වෙන අතර, එදිනම (2019.09.03) **පෙ.ව. 10.00** ට නුවරඑළිය ශ්‍රී ලංකා වන විද්‍යායතන පරිශ්‍රයේ පූර්ව ලංසු රැස්වීම පැවැත්වේ.

8. ලංසු, **2020.02.05** වෙනි දින දක්වා වලංගු විය යුතුය.

9. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. එම ලංසු ඇපකරය ලංසු ලිපිලේඛනයට අමුණා ඇති ආකෘතිය පරිදි "ව්‍යාපෘති අධ්‍යක්ෂ, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය" යන නමින් නිකුත් කරන ලද රුපියල් විසිතුන් ලක්ෂයක (රු. 2,300,000.00) වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් විය යුතුය. ලංසු ඇපකරය 2020-03-06 වෙනි දින දක්වා වලංගු විය යුතුය. වලංගු ලංසු ඇපකරයක් අමුණා එවා නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ලංසුකරුවන් ඔවුන්ගේ ලංසු සමග PCA3 ආකෘතිය (1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත) ඉදිරිපත් කළ යුතුය.

11. වැඩ බිම් සංචාරය සම්බන්ධ පිරිවැය හා වියදම් ඇතුළුව ලංසු පිළියෙල කිරීම සහ ගෙනැවිත් භාරදීම සඳහා ලංසුකරුවන්හට දරන්නට සිදුවෙන ඕනෑම පිරිවැයක් හෝ වියදමක් සම්බන්ධයෙන් සේවා යෝජකයා වගකියනු නොලැබේ.

12. ඕනෑම ලංසුවක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය**
**"සම්පත්පාය", අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**
**දුරකථන අංක : 0112888426/ 0112888427**
**www.escamp.lk**
**16-08-2019**